ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1940/28 - 2015 නොවැම්බර් මස 13 වැනි සිකුරාදා - 2015.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### කුරුණෑගල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ලේකම් දෙලංකාගේ දුර්ගා වික්‍රමසිංහ වන මම නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 2015.11.02 දිනැති 636 අංක දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (I) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කිය විය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2014.10.01 වන දින අංක 1882/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශෙෂ) *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරනු ලැබූවාවූද එකී *ගැසට්* නිවේදනයට සංශෝධනය වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශෙෂ) *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ 2015.01.20 දින හා 1898/28 අංකයෙන් ප්‍රකාශයට පත් කරනු ලද්දවූද නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

11 - 797

1A - PG 2688 — 08 (2015/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*